# මූලාය ගනුදෙනුකාර ප්‍රවේශයතා ප්‍රතිපත්තිය

සොෆ්ට්ලොජික් ෆයිනෑන්ස් පීඑල්සී

2024

1 සංස්කරණය

## පටුන


1. හැඳින්වීම ... 3
2. නිර්වචන ... 3
3. විෂය පථය ... 3
4. සම්බන්ධිත ප්‍රතිපත්ති ... 4
5. භූමිකාවන් හා වගකීම් ... 4
6. ලේඛන, සන්නිවේදන හා තොරතුරු ප්‍රවේශ්‍යතාව ... 4
7. වෙබ් අඩවියෙහි ප්‍රවේශ්‍යතාව ... 5
8. ජංගම යෙදවුම්වල ප්‍රවේශ්‍යතාව ... 6
9. යටිතල පහසුකම්වල ප්‍රවේශ්‍යතාව ... 6
10. මූල්‍ය සාක්ෂරතාව හා අධ්‍යාපනය ... 6
11. ප්‍රජාවගේ භාවිතයට ඇති හැකියාව ... 7
12. පොදු අවශ්‍යතා ... 7
13. සමාලෝචනය හා වාර්තා කිරීම ... 7

## 1. හැඳින්වීම

සොෆ්ට්ලොජික් ෆයිනෑන්ස් පීඑල්සී (SF PLC) ආයතනය තම ඇල්මැති පාර්ශවයන්ට ප්‍රවේශ විය හැකි මූල්‍යකරණ පරිසරයක් සැපයීමට කැපවී සිටින අතර වෙනස්කොට සැලකීම කෙරෙහි ඇති ඉවසීම ශූන්‍ය මට්ටමෙහි පවත්වා ගැනීමට බැඳී සිටියි. සැමට ම අප වෙත ප්‍රවේශ විය හැකිවීම තහවුරු කිරීම සඳහා අපගේ සමාගම ගන්නා පියවර මෙන්ම ප්‍රවේශ්‍යතාව සහතික කිරීම සඳහා වන අපගේ කැපවීම මෙම ප්‍රතිපත්තියෙන් සන්නිවේදනය කෙරේ.

විශේෂ අවශ්‍යතා ඇති මූල්‍ය ගනුදෙනුකරුවන් (FC) සඳහා මූල්‍ය සේවා වෙත ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව අප මූල්‍ය සමාගම විසින් හඳුනාගෙන ඇත. එවැනි පියවර හරහා මූල්‍ය සේවා සපයන්නන් විසින් පිරිනමනු ලබන ඩිජිටල් හා භෞතික පහසුකම් විශේෂ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන්ට පහසුකම් සැලසීම සඳහා නිර්මාණය වී තිබීම තහවුරු කෙරේ. මෙම කැපවීම පුද්ගලයින්ගේ සමාජ තත්ත්වය, ශාරීරික හැකියාව, විවාහක තත්ත්වය, ජාතිය, කුලය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වයස, ආගම හෝ මූල්‍ය සාක්ෂරතාව නොසලකා ව්‍යාප්ත වේ.

ගනුදෙනුකරු-කේන්ද්‍රීය සේවය හා ඇතුළත්භාවය සඳහා වන කැපවීමක් පෙන්නුම් කිරීමෙන් නීතිමය අවශ්‍යතා සපුරාලීම සහ ධනාත්මක කීර්තියක් ගොඩනගා ගැනීමට මූල්‍ය ගනුදෙනුකාර ප්‍රවේශ්‍යතා ප්‍රතිපත්තිය මූල්‍ය සමාගම් සඳහා උපකාරී වේ. මෙම ප්‍රවේශය ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය, පක්ෂපාතීත්වය සහ පිරිනමනු ලබන මූල්‍ය සේවා සමඟ සමස්ත සම්බන්ධතාව වැඩි දියුණු කරයි.

## 2. නිර්වචන

- ‘‘ප්‍රවේශ්‍යතාව’’ යන්නෙන් අදහස් කරන්නේ SF PLC ආයතනය විසින් සපයනු ලබන සියලුම මූල්‍ය සේවාවන් වෙත සමාන හා සාධාරණ ප්‍රවේශයක් සැපයීමයි.
- ‘‘මහ බැංකුව/ CBSL’’ යන්නෙන් අදහස් කරන්නේ 1949 අංක 58 දරණ මුදල් නීති පනත (422 පරිච්ඡේදය) යටතේ ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවයි.
- ‘‘මූල්‍ය ගනුදෙනුකරු/ මූල්‍ය පාරිභෝගිකයා’’ යන්නෙන් අදහස් වන්නේ මූල්‍ය සේවා සපයන්නන් විසින් සපයනු ලබන ඕනෑම මූල්‍ය නිෂ්පාදනයක් හෝ සේවාවක් භාවිත කරන, භාවිත කර ඇති හෝ භාවිත කිරීමේ විභවයක් සහිත පුද්ගලයෙකු, ආයතනයක්, නීතිමය ආයතනයක් හෝ සන්දර්භයට අනුකූලව එවැනි ගනුදෙනුකරුවෙකුගේ නීත්‍යානුකූල නියෝජිතයෙකි.
- "මූල්‍ය සේවා සපයන්නන්" යන්නෙන් අදහස් වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම්, බලපත්‍රලාභී ප්‍රාථමික අලෙවිකරුවන්, බලපත්‍රලාභී මූල්‍ය තැරැව්කරුවන්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සහභාගිවන්නන් හෝ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් ඕනෑම ආකාරයක මූල්‍ය සේවා සපයන්නන් ය.

## 3. විෂය පථය

2023 අගෝස්තු 09 දිනැති අංක 2344/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා 1949 අංක 58 දරණ මුදල් නීති පනතෙහි 10(c) යන වගන්තිය යටතේ ඉහත සඳහන් කළ 2023 අංක 01 දරණ මූල්‍ය ගනුදෙනුකාර ආරක්ෂණ රෙගුලාසි (FCPR) වලට අනුකූල වන සොෆ්ට්ලොජික් ෆයිනෑන්ස් පීඑල්සී හි සියලුම

සේවකයින්ට මෙන්ම ගනුදෙනුකරුවන්ට, සැපයුම්කරුවන්ට, කොටස් හිමියන්ට, උපදේශකයින්ට හෝ සමාගම සමඟ ව්‍යාපාරික සබඳතා ඇති වෙනත් ඕනෑම පාර්ශවයකට මෙම ප්‍රතිපත්තිය අදාළ වේ.

## 4. සම්බන්ධිත ප්‍රතිපත්ති

මෙම ප්‍රතිපත්තිය පහත ලැයිස්තුගත කර ඇති මූල්‍ය සමාගමේ සෙසු ප්‍රතිපත්ති, ප්‍රධාන ලේඛන හා මාර්ගෝපදේශ සමඟ කියවිය යුතුය.

i. ලිංගික අතවර පිළිබඳ ප්‍රතිපත්තිය
ii. පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය
iii. තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙල

## 5. භූමිකාවන් හා වගකීම්

- සමාගමේ ගනුදෙනුකාර ප්‍රවේශ්‍යතා ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා කළමනාකාරිත්වය වගකිව යුතු අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය.
- මූල්‍ය ගනුදෙනුකාර ආරක්ෂණ කාර්යයන් අධීක්ෂණය කරනු ලබන ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල සාමාජිකයින්, ශාඛා කළමනාකරුවන්, ගනුදෙනුකාර සේවා භාර නිලධාරීන් හෝ දෙපාර්තමේන්තු/ ඒකක ප්‍රධානීන් කලාපයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යයන්හි ප්‍රවේශ්‍යතා සම්බන්ධීකාරක වශයෙන් නම් කරනු ලැබේ.
- සම්බන්ධීකාරකවරයා ඔහුගේ/ ඇයගේ විෂය පථය යටතේ ඇති ශාඛාවේ/ දෙපාර්තමේන්තුවේ/ ඒකකවල සියලුම ප්‍රවේශ්‍යතා පියවරයන් සම්බන්ධීකරණය කිරීම පිළිබඳව වගකිව යුතුය.

## 6. ලේඛන, සන්නිවේදන හා තොරතුරු ප්‍රවේශ්‍යතාව

- SFPLC ආයතනය විසින් සිය මූල්‍ය නිෂ්පාදන, සේවා, තොරතුරු හා පහසුකම් වෙත සමාන හා සාධාරණ ප්‍රවේශයක් ලබා දීමත්, එහිදී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ සමාජ තත්ත්වය, ශාරීරික හැකියාවන්, විවාහක තත්ත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වයස, ජාතිය, කුලය, ආගම හෝ මූල්‍ය සාක්ෂරතාවයේ මට්ටම නොසළකා හැරීමත් අත්‍යාවශ්‍ය වේ.
- SFPLC ආයතනය, සිය මූල්‍ය නිෂ්පාදන හා සේවාවන් වෙත සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා, වැඩිහිටි, ශාරීරික දුර්වලතා සහිත, අඩු ආදායම්ලාභී සහ අඩු මූල්‍ය සාක්ෂරතාවය ඇති මූල්‍ය ගනුදෙනුකරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට උත්සාහ දරනු ඇත.
- SFPLC ආයතනය විසින් මූල්‍ය ගනුදෙනුකරුවන්ට අවශ්‍ය ලියකියවිලි, නියමයන් සහ කොන්දේසි හා පිරිනැමෙන නිෂ්පාදන සහ සේවාවන් පිළිබඳ තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු සපයා ඇති බව තහවුරු කළ යුතුය.
- මූල්‍ය ගනුදෙනුකරුට ඔහු විසින් බලය පැවරීමේ ලිපියක්, ඇටෝර්නි බලපත්‍රයක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් මගින් බලය පවරන ලද පුද්ගලයෙකුගෙන් සහාය ලබා ගැනීමට SFPLC අවසර ලබා දෙයි.
- මූල්‍ය ගනුදෙනුකරුගේ විද්‍යුත් අත්සන පැහැදිලි බවත්, සත්‍යාපන අරමුණු සඳහා පිළිගත හැකි බවත් SFPLC ආයතනය තහවුරු කරයි. මාපටැඟිලි සලකුණ, සාම්ප්‍රදායික අත්සනට සමානව සලකනු ලැබේ.

- ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ආබාධිතභාවය හා විශේෂ අවශ්‍යතා සම්බන්ධයෙන් පෞද්ගලිකත්වයේ අයිතියක් ඇති අතර, ඔවුන්ගේ ආබාධිතභාවය හා විශේෂ අවශ්‍යතා පිළිබඳ තොරතුරු ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා හැර වෙනත් කිසිදු හේතුවක් සඳහා භාවිතා කළ නොහැක.
- SFPLC ආයතනය විසින් සපයනු ලබන තොරතුරු මූල්‍ය ගනුදෙනුකරු කැමති පරිදි සරල සහ තේරුම්ගත හැකි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් විය යුතුය.
- තොරතුරු හා පැමිණිලි හැසිරවීම සඳහා බහුවිධ සන්නිවේදන මාර්ග ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම SFPLC ආයතනය විසින් තහවුරු කළ යුතුය.
- දෘශ්‍යාබාධිත මූල්‍ය ගනුදෙනුකරුවන් සඳහා මූල්‍ය අත්දැකීම් පහසු කිරීම/ වැඩිදියුණු කිරීම සඳහා සමාගම විසින් කාලරාමු සහිතව සැලසුම් සකස් කළ යුතුය.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇතුළත්කරණයේ වටිනාකම අවබෝධ කරගෙන ඇති බවත්, ප්‍රවේශ්‍යතාව ආශ්‍රිත ගැටළු සහිත සේවාදායකයින්ට ඇතිවිය හැකි ඕනෑම ගැටළුවක් සමඟ කටයුතු කිරීමට සූදානම් බවත් තහවුරු කරගැනීමට වගබලා ගත යුතුය. ප්‍රවේශ්‍යතා ප්‍රතිපත්තිය සමඟ අනුකූලතාව සාක්ෂාත් කර ගැනීම සඳහා, ප්‍රවේශ්‍යතාව පිළිබඳ නීති සහ රීති පිළිබඳව කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් බව SFPLC ආයතනය විසින් සහතික කරගත යුතුය.
- සෑම කෙනෙකුම පිළිගැනෙන, අගය කෙරෙන හා සම්පූර්ණයෙන් ම සම්බන්ධ වීමට ඉඩ සැලසෙන පරිසරයක් නිර්මාණය කිරීම, ඇතුළත්භාවය පවත්වා ගැනීමෙන් අදහස් කෙරේ. ශාරීරික සීමාවන් නොසලකා, සේවාදායකයින්ට ගෞරවයෙන් හා බහුමානයෙන් සැලකීමට සිහි තබා ගැනීම ඉතා වැදගත් වේ.
- SFPLC ආයතනය විසින් සාමාන්‍ය ක්ෂණික ඇමතුම් අංකයක් හා අභ්‍යන්තර ඇමතුම් මධ්‍යස්ථානයක් හරහා ගනුදෙනුකාර සන්නිවේදනයට පහසුකම් සැලසිය යුතුය.
- ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම ස්ථානවලට ස්ථාවර සාමාන්‍ය සම්බන්ධතා අංකයක් තිබිය යුතුය.
- ගනුදෙනුකරු රැඳී සිටීමේ කාලය අවම කිරීම හා ගනුදෙනුකාර අවශ්‍යතා අදාළ නිලධාරීන් වෙත යොමු කිරීම සඳහා SFPLC ආයතනය විසින් සෑම ගනුදෙනුකාර සම්බන්ධතා ස්ථානයකටම ගනුදෙනුකාර සේවා නිලධාරියෙකු පත් කර ඇති බව තහවුරු කරගත යුතුය.
- අදාළ මහ බැංකු නියෝගවලට අනුකූල වීම සඳහා සියලුම ගනුදෙනුකාර සම්බන්ධතා ස්ථාන CCTV මඟින් ප්‍රමාණවත් පරිදි ආවරණය කළ යුතුය.

## 7. වෙබ් අඩවියෙහි ප්‍රවේශ්‍යතාව

අපගේ වෙබ් අඩවියෙහි විවිධ හැකියාවන් ඇති පුද්ගලයින්ට සංචලනය කළ හැකි හා භාවිත කළ හැකි බව සහතික කරමින්, මූල්‍ය ගනුදෙනුකාර අත්දැකීම් සඳහා අපි ප්‍රමුඛතාව දෙමු.

- අකුරු ප්‍රමාණය, වර්ණය සහ වර්ණ වෙනස සකස් කිරීමේ හැකියාව.
- සම්පූර්ණ සංචලන හැකියාව හා යතුරුපුවරුව සමඟ ක්‍රියා කිරීමේ හැකියාව.
- තිර කියවනයන් සමඟ සම්පූර්ණ කියවීමේ හැකියාව.
- සියලුම වෙබ් අංගයන් නිසි පරිදි සලකුණු විය යුතුය, නැතහොත් විකල්ප පෙළ භාවිත විය යුතුය.
- සියලුම ආරක්ෂාව, ආරක්ෂණය හෝ ප්‍රවේශම් සහිත බව විශේෂාංග පෙළ තුළ සැපයිය යුතුය.
- සියලුම කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් දිය යුතුය.

## 8. ජංගම යෙදවුම්වල ප්‍රවේශ්‍යතාව

අපගේ විද්‍යුත් අවකාශ ප්‍රවේශ්‍යතාව පිළිබඳ ඇතුළත්භාවය මනසේ තබාගනිමින් නිර්මාණය කර ඇති අතර ඊට පහත දේ ඇතුළත් විය යුතුය, නමුත් ඒවාට සීමා නොවිය යුතුය.

- අකුරු ප්‍රමාණය, වර්ණය සහ වර්ණ වෙනස සකස් කිරීමේ හැකියාව.
- සම්පූර්ණ සංචලන හැකියාව හා යතුරුපුවරුව සමඟ ක්‍රියා කිරීමේ හැකියාව.
- තිර කියවනයන් සමඟ සම්පූර්ණ කියවීමේ හැකියාව.
- සියලුම වෙබ් අංගයන් නිසි පරිදි සලකුණු විය යුතුය, නැතහොත් විකල්ප පෙළ භාවිත විය යුතුය.
- සියලුම ආරක්ෂාව, ආරක්ෂණය හෝ ප්‍රවේශම් සහිත බව විශේෂාංග පෙළ තුළ සැපයිය යුතුය.
- සියලුම කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් දිය යුතුය.

## 9. යටිතල පහසුකම්වල ප්‍රවේශ්‍යතාව

නව ගොඩනැගිලි ඉදිකිරීමේදී හෝ කුලියට ගැනීමේදී, ආබාධිත සහ වැඩිහිටි මූල්‍ය ගනුදෙනුකරුවන්ට පහසුකම් සැලසීම වැනි ප්‍රවේශ්‍යතාව පිළිබඳ සාමාන්‍ය නීතිවලට සමාගම අනුකූල විය යුතුය.

- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට පහසුකම් සැලසීම සඳහා ගොඩනැගිලිවලට ඇතුළුවීමේදී ප්‍රමාණවත් ප්‍රවේශ විය හැකි මාර්ග, පඩිපෙළ හා බෑවුම්/ආනතීන් ඇති බව සමාගම තහවුරු කළ යුතුය.
- ශාඛා පිවිසුම් වෙත යන මාර්ගයන් බාධක වලින් තොර බව සමාගම විසින් තහවුරු කරගෙන සෑමට පැහැදිලි හා ආරක්ෂිත මාර්ගයක් තහවුරු කළ යුතු ය.
- මාංශ පේශීමය හැකියාවෙන් විවිධ වූ පුද්ගලයින්ට පහසුවෙන් ග්‍රහණය කර ගත හැකි සහ ක්‍රියාත්මක කළ හැකි ද්වාර දෑඩාංග තෝරා ගැනීමට සමාගම දිරිමත් කළ යුතුය.
- ශාඛාව/ ස්ථාන පරිශ්‍රය සහ අවශ්‍ය සේවාව වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා ගනුදෙනුකරුවන්ට සහාය වන පැහැදිලි සහ දෘශ්‍යමාන සංඥා පුවරුවක් (නාම පුවරුව) ස්ථාපනය කළ යුතු ය.
- ඕනෑම හේතුවක් නිසා ගනුදෙනුකරුවන්ට පැමිණීමට අවශ්‍ය විය හැකි අවස්ථාවක SFPLC ආයතනයේ මෙහෙයුම් සිදුකෙරෙන ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම ස්ථානවල සමාගමේ නාම පුවරුව හා පැහැදිලි ප්‍රවේශ දිශාවක් (උදා: පොදු ගොඩනැගිල්ලක බිම් මහලට මාර්ගෝපදේශය) ප්‍රදර්ශනය කළ යුතුය.
- ආරක්ෂාව සහ සංචලනය සඳහා ප්‍රමාණවත් ආලෝකකරණයක් අත්‍යවශ්‍ය වේ. දෘශ්‍යාබාධිත පුද්ගලයින්ට උපකාරී වීම සඳහා පිවිසුම් හොඳින් ආලෝකමත් කර ඇති බවට තහවුරු කළ යුතුය.
- පහසු සහ බාධක රහිත ප්‍රවේශයක් ලබා ගත හැකිවීම සඳහා ප්‍රවේශ විය හැකි පිවිසුම් වාහන නැවැත්වීමේ ස්ථාන වලට ආසන්නව පිහිටා තිබිය යුතු ය.

## 10. මූල්‍ය සාක්ෂරතාව හා අධ්‍යාපනය

SFPLC ආයතනය මූල්‍ය සාක්ෂරතාව බොහෝ ආකාරවලින් ප්‍රවර්ධනය කරන අතර එම ක්‍රමවලින් ප්‍රධාන එකක් වන්නේ ගනුදෙනුකරුවන්ට මූල්‍ය සාක්ෂරතාවය සහ අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වන පරිදි මූල්‍ය නිෂ්පාදන සැලසුම් කිරීම සහ ප්‍රවර්ධනය කිරීමයි. නිෂ්පාදන ප්‍රවර්ධන අතරතුර, SFPLC ආයතනය මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි පවත්වයි.

## 11. ප්‍රජාවගේ භාවිතයට ඇති හැකියාව

අපගේ ප්‍රවේශ්‍යතා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම, මහජනතාවට පහසුවෙන් ලබා ගත හැකි වනු ඇත. ප්‍රවේශ්‍යතාව වෙනුවෙන් වන අපගේ කැපවීම පිළිබඳව ඇල්මැති පාර්ශ්වකරුවන්ට හොඳින් දැනුවත් කෙරෙන බව තහවුරු කරමින්, මෙම තොරතුරු ප්‍රවේශ්‍ය ආකෘතිවලින් බෙදා හැරීමේ වැදගත්කම අපි අවබෝධ කර ගනිමු.

## 12. පොදු අවශ්‍යතා

අදාළ ප්‍රවේශ්‍යතා නීති සහ ප්‍රමිතීන්ට අනුකූල බව තහවුරු කරගැනීම සඳහා SFPLC ආයතනය විසින් සමාගම් ප්‍රතිපත්ති හා භාවිතයන් නිතිපතා සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතු ය.

ප්‍රවේශ්‍යතාව පිළිබඳ තීරණ ගැනීමේදී විවිධ වෙනස් කණ්ඩායම්වල පුද්ගලයින්ගෙන් ප්‍රතිපෝෂණය ලැබීම SFPLC ආයතනය විසින් දිරිමත් කළ යුතු අතර ඔවුන්ගේ යෝජනා හා අදාළ කාරණා සැලකිල්ලට ගත යුතු ය.

වෙනස්කම් කිරීම හෝ ප්‍රවේශ්‍ය නොවීම දිරිමත් කෙරෙන කිසිදු ප්‍රතිපත්තියක් හෝ චක්‍රලේඛයක් SFPLC ආයතනය විසින් නිකුත් නොකළ යුතු ය.

## 13. සමාලෝචනය හා වාර්තා කිරීම

ප්‍රතිපත්තියේ සැලකිය යුතු වෙනසක් සිදු වූ විට හෝ අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් නියාමන පරිසරයේ වෙනසක් කළ විට මෙම ප්‍රතිපත්තිය සමාලෝචනය කරනු ලැබේ.

SFPLC ආයතනය අවශ්‍යතාවන්ට අනුව සමාලෝචනය කිරීම සඳහා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් මෙම වාර්තාව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණනය අවම වශයෙන් ඔවුන්ගේ ආවර්තිතා අනුකූලතා විගණනයේ කොටසක් ලෙස අධීක්ෂණ යාන්ත්‍රණයක් ලෙස ඉහත අනුමත ප්‍රතිපත්තියට ඇති ඕනෑම අපගමනයක් BAC වෙත වාර්තා කරනු ඇත.